දැනුම සෙවුම

# පෘථිවියේ නව පෙනුම

වසර ගණනක් තිස්සේ විද්‍යාඥයන් සෑහෙන පමණ නිවැරදිව පෘථි-වියේ හැඩය පිළිබඳව අදහස් ඇති කර ගෙන සිටිය ද, මිනිසුනට හා උපකරණවලට පෘථිවි ග්‍රහයා දෙස බැහැරව සිට බලන්නට ඉඩ ලැබෙන තුරු, එනම් කක්ෂීය චන්ද්‍රිකා මගින් බලන තුරු ඇත්තවශ-යෙන් ම නියම පැතිකඩක් දැකිය හැකි නොවී ය. එසේ දුර සිට පෘථිවිය දෙස බලන්නට අවස්ථාව ලැබුණු පසු විස්මිත හා අනපේක්-ෂිත ලකුණු කීපයක් ම දැකගත හැකි විය.



අවකාශ තරණයේ දෙවැනි දශ-කයේ මැද හරියේ දී අති විචිත්‍ර 'හඳ මත ඇවිදීම' ලොව පුරා අවධාන-යට ලක් විය.

1957 දී උඩු ගුවනට යැවුණු ස්පුට්නික් – 1 චන්ද්‍රිකාවේ පටන් යවනු ලැබූ සියගණනක් චන්ද්‍රිකාවලින් කෙරුණු විද්‍යාත්මක අධ්‍යයනයන් වැඩිපුර අවධානයට ලක්වූයේ නැත.



ඇමෙරිකාව හා රුස්යාව සාමාන්‍යයෙන් දින 8 කට වරක් බැගින් නිරීක්ෂණ චන්ද්‍රිකාවක් උඩු ගුවනට යැවී ය.





විශේෂයෙන් ම ඇමෙරිකානු චන්ද්‍රිකා පෘථිවියේ නව සිති-යමක් සැකසීමට අවශ්‍ය දැනුම ලබා දුන්නා ය. ඒ දැනුම ගෙවුණු සියවස පුරා ලත් දැනුමට සමාන විය.

වැඩි ප්‍රසිද්ධියක් ලත් හඳ තරණ තරගය පසුපස ඇමෙරිකානු විද්‍යාඥයෝ අභ්‍යවකාශය තුළ පෘථිවිය පෙනෙන හැටි යළි සිතුවම් කිරීමට තැත් කළහ.



පෘථිවියේ හැඩය මීට වසර 10 කට පෙර අප දැන සිටි හැඩයට, එනම් ධ්‍රැව දෙකෙන් පැතලි ගෝලයකට වඩා වෙනස් බව දැන් අපි දනිමු.






මේ නව ගෝලාකාර හැඩය පිළිබඳ ඉඟි අපට දැනගත හැකි වූයේ 1958 දී යවනු ලැබූ වැන්-ගාඩ් – 1 කෘත්‍රිම චන්ද්‍රිකාවෙනි. එහෙත් මේ සඳහා අවශ්‍ය උප-කරණ පවා එහි නොවී ය.



වැන්ගාඩ් චන්ද්‍රිකාවේ කක්ෂය ඔස්සේ යන විට එය සුළු වෙනස්-කම් සහිත අක්‍රමවත් එකක් බව විද්‍යාඥයන්ට වැටහිණ.




සූර්ය ශක්ති ප්‍රවාහය ලබන කලාපයේ